# Abstract No 64

## අනුස්වාරය නාසිකාක්ෂරයක් ද? කණ්ඨ්‍යාක්ෂරයක් ද? යන්න පිළිබඳ ව සංස්කෘත සහ සිංහල ව්‍යාකරණයේ මත විමසුමක්

**නර්මදා කමලවීර**
විශේෂවේදී සිව්වන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
thilankakamalaweera@gmail.com

සංස්කෘතයේ ‘අනුස්වාරය’ , පාලියේ ‘නිග්ගහීතය’ , සිංහලයේ ‘බින්දුව’ යනුවෙන් හැඳින්වෙන අනුස්වාරය සිංහලයේ මාතෘගත භාෂා වන පාලි හා සංස්කෘතයේ ආභාසයෙන් සිංහලයට පැමිණ ඇත. ව්‍යාකරණඥයන් අතර වැඩි වශයෙන් මතභේදයට ලක් වූ අක්ෂරයක් වන අනුස්වාරය සම්බන්ධයෙන් වන එක් මතයක් ලෙස මෙය නාසික්‍යාක්ෂරයක් ද? කණ්ඨ්‍යාක්ෂරයක් ද? යනුවෙන් සංස්කෘත සහ සිංහල ව්‍යාකරණයේ වන අදහස් විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ පරමාර්ථය යි. මේ සඳහා සංස්කෘත සහ සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ මූලාශ්‍රය වී ඇත. අනුස්වාරය සංස්කෘත භාෂාවේ පිළිගෙන ඇත්තේ නාසික්‍යාක්ෂරයක් වශයෙනි. පාලි ව්‍යාකරණයේ ද අනුස්වාරය නාසික්‍යාක්ෂරයක් ලෙස පිළිගෙන ඇත. එසේ ම බොහෝ සිංහල ව්‍යාකරණඥයන් ද මේ මතය ගරු කරන්නට විය. එහෙත් ඇතැම් සිංහල ව්‍යාකරණඥයන් මේ මතයට පරිබාහිරව අනුස්වාරය කණ්ඨ්‍යාක්ෂරයක් ලෙස ද පිළිගෙන ඇත. ඊට හේතුව වර්තමානයේ කවර්ගාන්ත අනුනාසිකය වන ‘ඞ’ කාරය වෙනුවට අනුස්වාරය භාවිත වීම යි. ඒ අනුව අද වන විට සිංහලයේ මෙම කණ්ඨ්‍යාක්ෂරය සම්පූර්ණයෙන් ම අභාවිත බව ද හඳුනාගත හැකි ය. එය කෙතරම් සිංහලයට බලපෑවේ ද යත් ඇතැම් සිංහල අක්ෂරමාලාවන්හි ‘ඞ’ කාරය වෙනුවට අනුස්වාරය යොදා ඇති ආකාරය ද හඳුනාගත හැකි ය. එහෙත් මෙම අක්ෂරද්වය අතර වෙනස්කම් ගණනාවක් ඇත. ඒ අනුව ‘ඞ’ කාරය වෙනුවට අනුස්වාරය යෙදීම සම්භාවිත මතයක් නොවන බව ඇතැම් විද්වතුන් පැවසුව ද අනුනාද රන්ධ්‍ර ස්වරූප විසින් එම අක්ෂර දෙකෙහි ඇති ආසන්නතාව මත වෙනත් අනුනාසික අක්ෂරයන්ට වඩා ‘ඞ’කාරය හා අනුස්වාරය අතර ශ්‍රැති සාම්‍යයක් ඇතැයි යන හැඟීම විද්වතුන් අතර පැවතීම මෙලෙස අනුස්වාරය කණ්ඨ්‍යාක්ෂරයක් ලෙස පිළිගැනීමට හේතුව යි. එසේ හෙයින් අනුස්වාරයේ උපත අනුව සංස්කෘත , පාලි භාෂාවන්හි සහ ඒ අනුව ගිය පැරණි සිංහල ව්‍යාකරණඥයන්ගේ ද පිළිගැනීම මත අනුස්වාරය නාසික්‍යාක්ෂරයක් ලෙස පිළිගත යුතු අතර ම වත්මන් සිංහල භාවිත ව්‍යාකරණයේ ‘ඞ’ අක්ෂරය වෙනුවට අනුස්වාරය යෙදීමේ සම්ප්‍රදායට අනුව මෙය කණ්ඨ්‍යාක්ෂර ගණයෙහිලා සැලකීම අනුචිත නොවන බව ද පිළිගත යුතු ය.

**ප්‍රමුඛ පදඃ** අනුස්වාරය , නිග්ගහීතය , බින්දුව , නාසික්‍යාක්ෂර , කණ්ඨ්‍යාක්ෂර ,